කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 දෙසැම්බර් - 2023 මාර්තු

මානවශාස්ත්‍ර පීඨය

ප්‍රතිබිම්බ කලා (නව/පැරණි නිර්දේශය)

ලෝක සිනමාව පිළිබඳ ගවේෂණය IMAT – E 2025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. "චලන චිත්‍රයේ බිහිවීම අහඹුවක් නොවේ." චලන චිත්‍රය බිහිවීමට බලපෑ අත්හදා බැලීම් පිළිබඳ අවධානය යොමු කරමින් මෙම මාතෘකාවට අදාලව සඟරාවකට ලිපියක් සම්පාදනය කරන්න.

02. මුල්කාලීන ඇමරිකානු හාස්‍යෝත්පාදිත (Comedy) සිනමාව සහ සිනමාකරුවන් පිළිබඳ ගවේෂණයක යෙදෙන්න.

03. වාර්තා සිනමාවට එයට ම ආවේණික වූ අනන්‍යතාවක් ඇත. පහදන්න.

04. "ඩේවිඩ් වෝක් ග්‍රිෆිත් (David Wark Griffith) භාවිතයට නො ගත් හෝ අනාගත සිනමාකරුවන්ට උපයෝගී කර ගැනීම සඳහා මග නොපෙන්වූ හෝ කිසිදු මූලධර්මයක් කළු සුදු සිනමාවේ නොමැත." විග්‍රහ කරන්න.

05. විට්ටෝරියෝ ඩී සිකා (Vittorio De Sica) ඉතාලියානු නව යථාර්ථවාදී (Neo Realism) සිනමාවේ ප්‍රමුඛත ම සිනමාකරුවෙකි. පහදන්න.

06. ප්‍රංශ නවරැල්ලේ පුරෝගාමී සිනමාකරුවන් හඳුන්වා ඉන් එක් සිනමාකරුවෙකුගේ සිනමාකෘති පිළිබඳ ඇගයීමක් කරන්න.

07. ලෝක සිනමාවේ ඔබ නැරඹූ විශිෂ්ට සිනමා කෘතියක් පිළිබඳ සිනමාත්මක ඇගයීමක් කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතුරින් ඔබ කැමති මාතෘකා <u>දෙකක් (02)</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.

- Kuleshov effect
- White Telephone Films
- The 400 Blows
- ක්වෙන්ටින් ටැරන්ටිනෝ (Quentin Tarantino)

****************************